# 11 ශ්‍රේණිය - පිළිතුරු

## පාඩම - 22 පාලකයනට මග කියන බුදු දහම

1. ■ දානය - රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම අර්ථවත් කෙරේ. කෘෂි කර්මාන්තය, වෙළෙඳාම, සත්ත්ව පාලනය, ආදී කිසියම් ජීවන වෘත්තියක් ආරම්භ කොට ක්‍රියාත්මක කරගෙන යෑමට අවශ්‍ය පහසුකම් පාලකයා විසින් ලබාදිය යුතු ය. ඒ තුළින් රටත් සමාජයත් ස්වයංපෝෂිත තත්ත්වයට පත්කළ හැකි ය. එම සුභ සාධක සේවා දානයට අයත් වේ.

■ සීලය - පාලකයා කායික හා වාචසික සංවරයෙන් යුක්ත වීම මෙයින් අදහස් වේ. පාලිතයෝ නිතර ම පාලකයා අනුකරණයට යොමු වෙති. ගව රැළේ නායකයා ඇදට ගමන් කරන විට සෙසු ගවයෝ ද ඇදට ගමන් කරති. නායකයා කෙළින් යන විට සෙසු අය ද කෙළින් යති. එබැවින් නායකයා අනෙක් අයට ආදර්ශයක් වෙමින් සිල්වත් ව ක්‍රියා කළ යුතු ය. ප්‍රතිපත්තිගරුක විය යුතු ය. චාරිත්‍ර වාරිත්‍ර ගැන සැලකිලිමත් ව ක්‍රියා කිරීම මූලික වශයෙන්ම සීලයට අයත් වේ.

■ පරිත්‍යාගය - පාලකයා රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුව යනාදිය කැප කළ යුතු ය. එම කැප කිරීම පරිත්‍යාගය ලෙස අර්ථවත් කෙරේ.

■ ඍජු බව දේශපාලන හිතවත්කම් හා ඥාති සබඳතා ද නිවැරැදි තීන්දු තීරණ ගැනීමට බාධක වේ. එවැනි බාධක සහ බලපෑම්වලට යොමු නොවී සතර අගතියෙන් තොර ව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවංක ව කටයුතු කිරීම පාලකයාගේ ඍජු ගුණය වේ.

■ මෘදු බව යනු හදවතේ ඇති මොළොක් බවයි, තෙත් ගතියයි. ජනතාවට ආර්ථික හා සාමාජික ආදි වශයෙන් විවිධ ගැටලු හා අභියෝගවලට මුහුණ පෑමට සිදුවේ. එවන් අවස්ථාවන්හි දී පාලකයා ඒවාට විසඳුම් ලබා දීමට යොමු විය යුත්තේ කාරුණික හැඟීමෙනි. මොළොක් වූ හදවතිනි. ජන දුක හැඳින ක්‍රියා කිරීමෙනි.

■ තපසප - ඉඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියා කිරීම තපසයි.

■ අක්‍රෝධය - ක්‍රෝධ චේතනාවෙන් තොර ව කටයුතු කිරීම අක්‍රෝධයයි. වෙනත් පාලකයකුට හෝ රට වැසියකුට වෛර කිරීම, ක්‍රෝධ කිරීම දැහැමි පාලකයකුගේ පිළිවෙත නොවේ. සියලු රටවැසියන් තමන්ගේ දරුවන් ලෙස සිතා කවර හේතුවක් නිසාවත් වෛරයෙන්, ක්‍රෝධයෙන්, කෝපයෙන් ක්‍රියා නොකිරීම අක්‍රෝධය ලෙස හැඳින්වේ.

■ අවිහිංසාව - පාලකයා හිංසා සහගත ක්‍රියාවලින් ද ඈත් විය යුතු ය. හිංසාව කායික මෙන් ම මානසික ව ද වේ. මිනිසා ඇතුළු සෑම සත්ත්වයෙකු ම හිංසනයට අකැමැති ය. අවිහිංසාවට කැමැති ය. එබැවින් නායකයාගේ වගකීම විය යුත්තේ සියලු ම හිංසාකාරී ක්‍රියාවලින් තොර ව මිනිසා ඇතුළු සෑම ජන කොට්ඨාසයක් ම පාලනය කිරීම ය. නමුත් රටේ පවත්නා නීතියට අනුගත ව දඬුවම් පැමිණවීමෙන් බැහැර වීමක් මෙයින් අදහස් නොකෙරේ.

■ ඉවසීම - පාලකයා අනිවාර්යයෙන් ම ඉවසිලිවන්ත අයෙකු විය යුතු ය. දුරදිග සිතාබලා කටයුතු කරන්නෙකු ද විය යුතු ය. එසේ නොවී ක්ෂණික තීරණවලට එළඹ කටයුතු කළහොත් රටක පමණක් නොව ඕනෑ ම සංවිධානයක නායකත්වයේ පිරිහීම කඩිනම් වන්නේ ය. තාරුණ්‍යය හා බලය, ඉවසීම පලවා හරින සාධක වේ. නොඉවසිල්ල බොහෝ ගැටලු ඇති කරන්නක් ය.



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

■ අවිරෝධතා - පාලකයකුට කටයුතු කිරීමට සිදුවන්නේ සම්පූර්ණයෙන් ම සමාන අදහස් දරන පිරිසක් සමග නොවේ. විවිධ අදහස් හා මතවාද දරන පිරිස් සමග මධ්‍යස්ථව හා ගැටුම්න් තොර ව කටයුතු කිරීම අවිරෝධතාවයි. තම අදහසට හෝ මතයට හෝ විරුද්ධ වූවා යැයි යමකුගෙන් පළිගැනීමට පාලකයකු යොමු වන්නේ නම් ඔහුට සාමකාමී සාර්ථක පාලනයක් කිරීමට නොහැකි වනු ඇත.

2.

| | | |
|---|---|---|
| 1. දානය | 5. මෘදු බව | 9. ඉවසීම |
| 2. සීලය | 6. තපස | 10. විරුද්ධ නොවීම |
| 3. පරිත්‍යාගය | 7. අක්‍රෝධය | |
| 4. ඍජු බව | 8. අවිහිංසාව | |

3. ■ සීලය, විරමණය

4. ■ පංච සීලය ද රාජ්‍ය පාලන මූලධර්මයක් වශයෙන් ගත හැකි ය. දේශය, කුලය, ජාතිය, ආගම කුමක් වුව ද ශිෂ්ඨ සම්මත වූ මානව සමාජයක් තුළ සැබවින් ම පංච දුෂ්චරිතය ගැරහුමට ලක් විය යුත්තකි.

■ පාලකයකු ප්‍රාණඝාතයෙන් වැළකීම යනු සමස්ත සත්ත්ව සංහතියේ ම ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීමකි. බියෙන් සැකෙන් තොර ව නිදහසේ තම ජීවිතය පවත්වාගෙන යෑමට සෑම අයකුට ම අවස්ථාව ලබා දීමකි. සමහර පාලකයින් තිරිසන්ගත සතුන්ගේ ජීවිත සුරක්ෂිත කරලීමේ අරමුණින් මාඝාත ආඥාව පවා පැනවූ බවට තොරතුරු ලක් ඉතිහාසයේ ද දැක්වේ. ඒ නිසා ප්‍රාණඝාතයෙන් වළකින හා වළක්වන අයෙක් විය යුතුය.

■ රාජ්‍ය පාලකයින් යනු ජනතාවගේ අයබදුවලින් යැපෙන පිරිසකි. ඒ නිසා ඔවුන්ගේ යුතුකම විය යුත්තේ මහජන දේපොළ සුරක්ෂිත කිරීමයි. ඒ නිසා පාලකයා ජනතාවගේ සම්පත් වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. පාලකයෙකු මහජන දේපොළ අනියමින් තමන් සන්තක කර ගැනීම සොරකම් කිරීමක් වේ. පාලකයා ජනතාවගේ සම්පත් සුරකින අයෙක් විය යුතුය.

■ පාලකයා සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන අයෙකු විය යුතු ය. පාලකයා වැරදි කාම හැසිරීමට යොමු නොවිය යුතු ය. වැරැදි ලෙස කාම සේවනයට යොමු වීමෙන් පාලකයකුගේ පෞරුෂය බිඳ වැටෙයි. ඔහු ප්‍රජාවට මග පෙන්වීමට නුසුදුස්සෙකු වේ. පිරිහුණු චරිතයක් ඇත්තකු ද වේ. එනිසා පාලකයා සදාචාර සම්පන්න විය යුතුය. එවැනි පාලකයන්ට ජනතා ආකර්ෂණය හිමිවේ.

■ පාලකයාගේ පැවැත්ම තහවුරු වීමට ඔහු පිළිබඳ ව ජනතාව තුළ විශ්වාසයක් තිබිය යුතු ය. ඒ සඳහා සත්‍ය වචන කතා කිරීම අත්‍යවශ්‍ය වේ. ඔහු කියන දේ කරන අයකු මෙන් ම කරන දේ කියන අයකු ද විය යුතු ය.තමන් බොරුවෙන් මුළාකිරීම නිසා ජනතාව පාලකයා කෙරෙහි ද්වේෂයෙන් කල් ගෙවන අතර; කලහකාරී ක්‍රියාමාර්ග තුළින් ප්‍රතිචාර දැක්වීමට ද පෙළඹිය හැකි ය. සත්‍ය වචන කතා කරන පාලකයෙක් රට වැසියා පාලකයාගෙන් බලාපොරොත්තු වේ.

■ මද්‍යසාර භාවිතයෙන් විකෘති වූ මානසිකත්වයක් ඇති අයෙකුට යුක්තිය හා සාධාරණය ඉටුකෙරෙන පරිදි තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් නැත. මතට යොමුවූ ඇතැම් පාලකයෝ බොහෝ විට අවස්ථාවාදීන්ගේ ගොදුරු බවට පත්වෙති. එවිට ඔවුහු තම සිතැඟියාවන් පාලකයා ලවා ඉටු කර ගැනීමට පෙළඹෙති. පාලකයන් බොහෝ අගතිගාමී තීරණවලට එළඹ විනාශ වන්නේ මේ නිසා ය. පාලකයා අනුකරණය කරමින් ජනතාව ද මතට යොමුවූ විට රට තුළ බොහෝ සමාජ හා ආර්ථික ගැටලු ඇතිවේ.

■ දැහැමි පාලකයා පන්සිල් රකී. අන් අයද පන්සිල් හි පිහිටුවයි. පස්පව් කරන අයට පන්සිල් රැකීමේ ආනිශංසය ද කියා දෙයි. පංච සීල ප්‍රතිපත්තිය ආරක්ෂා වන්නේ එසේ වූ විට ය. මේ කරුණු සැලකිල්ලට ගෙන පංච සීල ශික්ෂණයෙන් යුතු ව රටක් සමාජයක් පාලනය කරන පාලකයා නිසා සාමකාමී පරිසර වටපිටාවක් නිර්මාණය වේ. එය එම සමාජයේ ආර්ථික, දේශපාලනික, සාමාජික යන සියලු අංශවල සංවර්ධනයට හේතුවේ.

5. ■ චතු අප්පමඤ්ඤා

6. ■ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා

7. ■ මෙත්තා හෙවත් මෛත්‍රිය යනු හිතවත්කමයි. මිතුරු කමයි. සෑම පාලකයකු ම තම මිතුරකු සම්බන්ධ ව පවත්නා හිතවත්කමට සමාන හිතවත්කමක් තම රට වැසියන් කෙරෙහි ද, සියලු සත්ත්වයන් කෙරෙහි ද දැක්වීමට යොමු විය යුතු ය. එය කළ හැකි වන්නේ දියුණු කළ සිතුවිලි ඇති අයට පමණි. එබඳු පාලකයන්ගෙන් ජනතාවට කිසිදු අගතියක් සිදු නොවේ.

■ කරුණාව නම් දුකට පත් වූවන් දුකෙන් මුදවා ගැනීම සඳහා සිතෙහි ඇති වන අනුකම්පාවයි. පාලකයා නිතර ම සියලු රටවැසියන් තම දරුවන් ලෙස සිතා කටයුතු කළ යුතු ය. දරුවකුට විපතක්, කරදරයක් ඇති වූ විට වහා ම එයට විසඳුම් සෙවීමට යොමු වන පියකු මෙන් ක්‍රියා කළ යුතු ය.

■ අනුන්ගේ දියුණුව, දැක සතුටට පත් වීම, ඊර්ෂයා නොකිරීම මුදිතාවයි. රාජ්‍ය නායකත්වයට ද තම ජනතාවගේ දියුණුව හා සතුට දැක අවංක ව ම ඒ ගැන සිතා සතුටු වීමේ හැකියාවක් පැවැතිය යුතු ය. මුදිතාව තුළින් ක්‍රෝධය, පළිගැනීම වැනි අවගුණ සම්පූර්ණයෙන් ම බැහැර වේ. දයාව කරුණාව වැනි උතුම් ගුණ ජනිත කෙරේ.

■ කෙනකුගේ සිත තුළ උපදින මැදහත් බව උපේක්ෂාවයි. නමුත් කිසි ම දෙයක් ගණන් නොගෙන කටයුතු කිරීමේ ගතිය මෙයින් අදහස් නො කෙරේ. ජනතා සේවය සලසන පාලකයකුට ජනතාවගෙන් කීර්ති ප්‍රශංසා පමණක් නොව නින්දා අපහාස ද ලැබෙයි. ලාභ මෙන් ම අලාභ ද යසස මෙන් ම අයස ද හිමි වේ. ඒ කිසිවක් පිළිබඳ ව කම්පා නොවී උපේක්ෂාවෙන් පාලකයා කටයුතු කළ යුතුය.

■ සිව් බඹ විහරණයෙන් තම පාලන කටයුතු මෙහෙයවන පාලකයා කුමන මෙහොතකවත් ජාති, කුල, ආගම්, පක්ෂ, පාට ආදී පටු වාද භේද නොසලකා කටයුතු කරයි. එවිට ඔහු වෙත ජනතා ආකර්ෂණය නිතැතින් ම හිමිවේ. එබඳු පාලකයාගේ පැවැත්ම හා ප්‍රජාවේ යහපත සිදුවේ.